FACTSHEET

PUBLIC TRUSTEE AND GUARDIAN

# පොල්මක්කරුවෙකුගේ රාජකාරි

## ඔබගේ අන්තිම කැමති පත්‍රය

ඔබගේ අන්තිම කැමති පත්‍රය සකස් කිරීම ඔබගේ ජීවිත කාලයේ ගනු ලබන වඩාත්ම වැදගත් තීරණවලින් එකක්වේ. යම් අයෙකු අන්තිම කැමති පත්‍රයක් සකස් කරන විට ඔවුන් මියගිය පසු සිය කටයුතු බලා කියා ගැනීමට යම් අයෙකු තෝරා ගත යුතුවේ. මෙම පුද්ගලයා **පොල්මක්කරුවෙකු (executor)** වශයෙන් හඳුන්වයි.

## පොල්මක්කරුවෙකු යනු කවුරුන්ද?

පොල්මක්කරුවෙකු යනු ඔබට අවශ්‍ය ආකාරයට ඔබගේ බූදලය කළමණාකරණය කිරීම සහ ඔබගේ අවශ්‍යතාවය අනුව අර්ථලාභීන් හට වත්කම් පරිපාලනය කිරීම සහ බෙදා හැරීමට ඔබ විසින් තෝරා ගන්නා පුද්ගලයෙකි.

බොහෝ අය බූදලයක් කළමණාකරණය කිරීමේදී ඇති සංකීර්ණතාවයන් සහ ගතවන කාලය සම්බන්ධයෙන් අවබෝධයක් නැත.

## පොල්මක්කරුවෙකු කුමක් කරයිද?

## අර්ථලාභීන්ට දැනුම් දීම

පුද්ගලයෙකු මියගිය පසු පොල්මක්කරු විසින් අන්තිම කැමති පත්‍රය සොයගෙන, බොහෝ අවස්ථාවල අවමංගල්‍යය කටයුතු පිළියෙල කර, අර්ථලාභීන් හා හැකි විගස සම්බන්ධවේ.

## බූදලය බලා ගැනීම

පොල්මක්කරු විසින් සියළුම වත්කම් ආරක්ෂිත බව සහ රක්ෂණ ඔප්පු පිළියෙල කර ගන්නා බවට වග බලා ගත යුතුය. මියගිය අය විසින් කළමණාකරණය කල යුතු දේපළ හෝ ආයෝජන තබා ඇතිනම්, ඒවා බලා ගැනීමට අවශ්‍ය කටයුතු පිළියෙල කිරීම පොල්මක්කරුගේ රාජකාරියවේ.

## දේපළ තක්සේරු කිරීම

පොල්මක්කරු විසින් සියළුම වත්කම් සහ වගකීම් ලැයිස්තුගත කල යුතුය. එහි ඇති සෑම අයිතමයක් සම්බන්ධයෙන් අගය නිවැරදිද යන්න බලා ගැනීම සඳහා බැංකු, ගොඩනැගිලි සමිති, රක්ෂණ සමාගම්, කොටස් ලේඛණ, හිමිකම් කාර්යාලය, සමාගම් කාර්යාලය, ණයකරුවන් ආදී අයගෙන් ලිඛිත තහවුරු ලබාගත යුතුය.

## බූදලය පරිපාලනය සඳහා අධිකාරියක් ලබා ගැනීම

ඔබගේ පොල්මක්කරු විසින් සියළුම තොරතුරු එක්රැස් කර ගැනීමෙන් පසු ඔබගේ බූදලය පරිපාලනය කිරීම සඳහා ACT හි ශ්‍රේෂ්ඨාධිකරණය වෙතින් ප්‍රොබේට් බලපත්‍රයක් ඉල්ලා සිටීම බොහෝ විට අවශ්‍යවේ.



Ground Floor
221 London Circuit
Canberra City ACT 2601

PO Box 221
Civic Square ACT 2608

Tel (02) 6207 9800
Fax (02) 6207 9811

Email ptg@act.gov.au
Web www.ptg.act.gov.au

ශ්‍රේෂ්ඨාධිකරණය මගින් ප්‍රොබේට් බලපත්‍රය ලබාදුන් පසු පොල්මක්කරු හට මුදල් රැස් කිරීමට, ණය ගෙවීමට හෝ ඔබගේ අර්ථලාභීන් හට වත්කම් බෙදාදිමට නීත්‍යානුකූල බලය ලැබේ.

## බදු ගොනු කිරීම් සම්පූර්ණ කිරීම

බුදලය සම්පූර්ණයෙන් බෙදා දීමට පෙර ඕස්ට්‍රේලියානු බදු කාර්යාලය මගින් අවසරය ලබාගත යුතුය. මෙයින් අදහස් වන්නේ මියගිය අය විසින් කිසියම් බදු ගොනු කිරීමක් කිරීමට අසමත්වුණිනම්, පොල්මක්කරු විසින් වර්තමාන සහ පසුගිය මුදල් වර්ෂවල සියළුම ආදායම් තොරතුරු ලබා දිය යුතු බවයි. සමහර අවස්ථාවල ප්‍රාග්ධනයට එකතුවීමේ බදු (capital gains tax) ගණනය කලයුතුවේ.

## සියළුම ණය ගෙවීම

ණයහිමියන්, අවමංගල්‍ය වියදම්, ආදායම් බදු, බුදලය කළමණාකරණය සම්බන්ධ ගාස්තු සහ සුළු වියදම් සියල්ල ගෙවා දැමිය යුතුය.

## බුදලය බෙදීම

සියළුම ණය ගෙවා දැමූ පසු, අන්තිම කැමති පත්‍රයේ ඇති විධානයන්ට අනුව ඉතිරි වත්කම් බෙදා දැමීමට පොල්මක්කරු හට හැකිය.

## භාර ඇති කිරීම

අවසාන වශයෙන් පොල්මක්කරුවන් විසින් භාර ඇති කිරීම සම්බන්ධයෙන් වගකිවයුතුවේ. භාර අවශ්‍ය වන්නේ යම් අර්ථලාභියෙකු වයස අවුරුදු 18ට අඩුනම් හෝ මානසික ආබාධිතනම් හෝ අන්තිම කැමති පත්‍රයේ  ඒ සම්බන්ධ විශේෂ උපදෙස් ඇති අවස්ථාවලය. එවැනි භාර සම්බන්ධයෙන් වසර ගණනාවක් පුරා දිගින් දිගට පරිපාලනය අවශ්‍යවේ.

## මහා භාරකරු සහ භාරකරුව පත්කල යුත්තේ ඇයි?

පොල්මක්කරුගේ කාර්යභාරය අභියෝගාත්මක එකකි. ඒ සඳහා නීතිය, ගණකාධිකරණය සහ බදු අවශ්‍යතා සම්බන්ධ හොඳ අවබෝධයක් අවශ්‍යවේ. බොහෝ අය ඥාතියෙකු හෝ සමීප මිතුරෙකු පත් කරයි. එය දුෂ්කර සහ කාලය ගතවන දෙයක්වේ. මේ සඳහා මහා භාරකරු සහ භාරකරු පත් කිරීම මගින් දුකින් කල් ගතවන අවස්ථාවක මෙම වගකීම පවුලේ අයගෙන් සහ මිතුරන්ගෙන් ඉවත් කර ගත හැකිය.

මහා භාරකරවරයාගේ කාර්ය මණ්ඩලය ස්වාධීන වන අතර බුදල් පරිපාලනය සම්බන්ධයෙන් විශේෂඥතාව ලබා ඇත. ඔවුන් ඔබගේ බුදලය ඔබගේ පවුලේ අය සහ අර්ථලාභීන් වෙනුවෙන් නිපුණතාවයෙන් යුක්තව අපක්ෂපාතීව පරිපාලනය කරනු ඇත. ඔබගේ බුදලය පරිපාලනය කරන අතරතුර රැස් කරන කිසියම් මුදලක් ඇතොත් ඒවා කල්පනාවෙන් යුක්තව ආයෝජනය කර තරඟකාරී පොලී අනුපාත ලබාදෙනු ඇත.

මහා භාරකාරවරයා සතුව කුඩා බුදල් සම්බන්ධයෙන් සරල ක්‍රියාපටිපාටින් අනුගමනය කරමින් කටයුතු කිරීමට විශේෂ ව්‍යවස්ථාපිත බලතල ඇත.

මහා භාරකාරවරයා අඛණ්ඩ පැවැත්ම ඇති ආයතනයක් වන අතර දිගටම පවතී. මහා භාරකාරවරයා විසින් බුදලය පරිපාලනය කරන අතරතුර අරමුදල් කල්පනාකාරීව ආයෝජනය කර පොලී ලබා ගනී.



Ground Floor
221 London Circuit
Canberra City ACT 2601
PO Box 221
Civic Square ACT 2608
Tel (02) 6207 9800
Fax (02) 6207 9811
Email ptg@act.gov.au
Web www.ptg.act.gov.au

## මට දැනටමත් පොල්මක්කාරයෙක් සිටීනම් කුමක් සිදුවේද?

බොහෝ පොල්මක්කරුවන් සිය කාර්යය කරදරයක් ලෙස සලකයි. මෙම තත්වයේ සිටින පොල්මක්කාරයන් විසින් සිය රාජකාරි මහා භාරකාරවරයා හට පැවරිය හැකිය.



Ground Floor
221 London Circuit
Canberra City ACT 2601

PO Box 221
Civic Square ACT 2608

Tel (02) 6207 9800
Fax (02) 6207 9811

Email ptg@act.gov.au
Web www.ptg.act.gov.au